# අන්තද්වය හා මධ්‍යය දර්ශනය : ථේරවාද සම්ප්‍රදායයේ පර්යායන්

**දෙහිපාගොඩ විජිතානන්ද හිමි**[1]

සමකාලීන ආගමික හා දාර්ශනික ප්‍රවණතා හමුවෙහි අනන්‍යාත්මක ඉගැන්වීමක් වශයෙන් මතුවන බුදුදහම ශාස්වත හෝ උච්ඡේද දෘෂ්ටි ප්‍රතිබාහනය කරමින් මධ්‍යම දර්ශනයක් හා චරණයක් සහිත ව ශක්තිමත් ව ඇත. එහිදී සංයුත්ත නිකායේ ධම්මචක්කප්පවත්තන සූත්‍රයත් කච්චාන වච්ඡගොත්ත සූත්‍රයත් ප්‍රමුඛත්වයෙහි ලා ගැනේ. මෙම පර්යේෂණ පත්‍රය උභයාන්තය පිළිබඳවත් ඒ සඳහා සූත්‍ර සාහිත්‍යයේ පර්යායන් සහ අට්ඨකථාවන්හි ලබා දී ඇති ස්ථානය පිළිබඳවත් ය. ඒ තුළ ගම්‍යමාන ස්වාධීන න්‍යාය මතුකිරීමේ ශක්‍යතාවත් අවශ්‍යතාවත් මෙමගින් උද්දීප්ත කිරීමට අපේක්ෂිත ය.

අන්ත යන්නෙන් දෘෂ්ටාන්තයක් ගම්‍ය කෙරේ. ඒකාන්ත මතවාද හෝ දෘෂ්ටිවාද හෝ ප්‍රතිපක්ෂයක් ගොඩනගාගන්නා ස්වාන්තුක්කංසනය ස්වභාව කොට පවතී. ලොව පිළිබඳ එවැනි දෘෂ්ටිවාද දෙකක් විණි. ශාස්වත යන්නෙන් සත්ත්වයා හා ලෝකය පිළිබඳ නිත්‍යත්ත්වයත්, අශාස්වත හෙවත් උච්ඡේද යන්නෙන් සත්ත්වයා හා ලෝකය පිළිබඳ පැවැත්මේ ඡේද්‍යත්ත්වයත් ගම්‍ය කෙරිණි. (එය අනිත්‍යත්ත්වය නො වේ.) දාර්ශනික වශයෙන් මෙය, අත්ථීතං (නිත්‍ය යමක් ඇතැයි යන වාදය.) නත්ථීතං (නිත්‍ය යමක් නැතැයි යන වාදය.) වාදාරෝපිත වූ අතර චරණමය වශයෙන් අත්ථීතං පිළිගත්තවුන් අත්තකිලමතානු යෝගයත් නත්ථීතං පිළිගත්තවුන් කාමසුබල්ලිකානු යෝගයත් පිරිවැසූ බව බෞද්ධ සූත්‍රානුසාරයෙන් ම ගම්‍යවේ. අන්තද්වය ප්‍රතිබාහනය කරන බෞද්ධ ප්‍රතිපදාව මගින් මධ්‍යම ප්‍රතිපදාවක් හඳුන්වා දෙයි. ඒ ආර්යෂ්ටාංගික මාර්ගය යි. අන්තද්වය බැහැර කරන බෞද්ධ දාර්ශනික ඉගැන්වීම මගින් මධ්‍යම ඉගැන්වීම වශයෙන් බෞද්ධ සාපේක්ෂතාව හෙවත් පටිච්ච සමුප්පාදය ගෙනහැර දක්වයි.

ථෙරවාද සම්ප්‍රදායයේදී උභයාන්තය අර්ථගැන්වීමේ දී වැඩි වශයෙන් යොදාගෙන ඇත්තේ කච්චායන වච්ඡගොත්ත සූත්‍රාගත ඉගැන්වීම යි. එහෙත් දාර්ශනික වැදගත්කමෙන් යුක්ත වුව ද

[1] Dep. of Buddhist and Pali Studies, University of Sri Jayewardenepura,

අංගුත්තර නිකායයේ මජ්ඣේ සූත්‍රය වෙනස් මගක් ගෙන ඇත. ඒ කෙරෙහි අවධානය යොමු නො කිරීමෙන් ධර්මය විවර කිරීමේ ක්‍රියාවලියට යම් බාධාකිරීමක් හා අසාධාරණයක් සිදුකොට ඇති සෙයක් පෙනෙයි. පූර්ණ වශයෙන් නොමැති වුව ද අට්ඨකථා තුළ උභයාන්තයට ශාස්වත හා උච්ඡේද යන්න භාවිත කිරීම පිළිබඳ අවාචික ප්‍රතිවිරෝධයක් තිබුණේ යැයි අනුමාන කළ හැකි ය. බුද්ධඝෝෂ හිමියන් සිය අටුවා රචනයන්හි එකහෙළා ම උභයාන්තය ශාස්වත උච්ඡේද යැයි දැක්වුව ද උපසේන හිමියන් එයට එකඟ වූ බවක් නො පෙනෙයි. ඒ ථේරවාද සූත්‍රාගත ව පර්යාය න්‍යායයන් පැවති බැවිනි. එම පර්යාය අට්ඨකථාචාර්ය බුද්ධඝෝෂ හිමිගේ ද උතුරු බුදුදහමේ ද මාධ්‍යමික දර්ශනයෙන් ද වැළලී ගිය බවට අනුමාන කළ හැකි ය.

ප්‍රමුඛ පදඃ උභයාන්තය, මධ්‍යය, ප්‍රතිබාහනය, පර්යාය

**Title:** Two Extremes and Middle Philosophy: Theravada Interpretations

**Keywords:** both extremes, the middle, exclusion, in all meaning